
මව්රට දැන් ඉරිදා
2026 ජුනි 21
Channa & Apsara
Click by NEXUS Photography



# පොඩි වුණාට ලොකු වැඩ කෝටියක් කරන

# පට්ටි ගෙදර පුංචි නන්දනී...

**සිනමාවේත්, පුංචි තිරයේත් ආදරණීය මේ පුංචි කෙල්ල ගැන මේ දිනවල කාගේත් අවධානය යොමුවෙලා. ඒ නිසාම ඇය ගැන ගොඩ දෙනෙක් හොයන්නත් පටන් අරගෙන. 'පට්ටි ගෙදර' ටෙලිනාට්‍යයේ නන්දනීගේ ළමා අවධියට ඉතා තාත්වික ලෙස ඇය පණපොවනවා. රංගනයට වගේම නැටුමටත් හපන් ට්‍රිනිටි 'මව්රට' හාට් පිටු හැඩ කරන්න එකතු වුණේ මේ විදියටයි.**

**ට්‍රිනිටි මේ දිනවල පොඩි වුණාට ලොකු වැඩ ගොඩක් අපි දකිනවා?**

මම තාම පොඩි කෙනෙක් තමයි. පට්ටි ගෙදර නාට්‍යයේ පුංචි නන්දනී, වරකත නාට්‍යයේ ලිසා, මායාවී නාට්‍යයේ ලීසා, සිත නිදි නෑ නාට්‍යයේ අමේලි වැනි ආදරණීය චරිත මම රඟපානවා. ඉදිරියේදී තාල මණ්ඩිය ටෙලිනාට්‍යයේ කුමී ලෙසට මගේ රඟපෑම් දැකගන්න පුළුවන්. තවත් අලුත් ටෙලිනාට්‍ය කිහිපයකින්ම මට ආරාධනා ලැබුණා.

**මේ තරම් වැඩ ගොඩක් හිරවෙනකොට පාසල් වැඩකටයුතු අතපසු වෙන්නේ නැද්ද?**

මම මොන දේ කළත් පාසල් වැඩකටයුතුවලට මුල් තැන දෙනවා. මම පාසල් යන්නේ පොලිමත් ජාත්‍යන්තර පාසලට. මම දැන් 4 වසරේ ඉගෙනුම ලබනවා. පන්ති භාර ගුරුතුමියත්, අනෙකුත් ගුරුවරුත් මට ගොඩක් උදව් කරනවා. මගහැරෙන පාඩම් වැඩ කරගන්න ඒ අය උදව් කරනවා. මගේ හොඳම යාළුවා සඳරුවි මට ගොඩක් උදව් කරනවා. ඉතින් මේ සියලු දෙනාගෙන් ලැබෙන සහායත් එක්ක මගේ පාසල් කටයුතු අතපසු වීමක් වෙන්නේ නැහැ.

**මේ තරම් හොඳට රඟපාන්නේ කොහොමද?**

පිටපත එක පාරක් මම බලලා චරිතය අවබෝධ කරගන්නවා ඒ සිටුවේෂන් එකට මගේ රඟපෑම කොහොමද වෙන්න ඕනේ කියලා. මගේ හිතට අරගෙන ඒ වෙලාවට මම ඒ චරිතය තුළ ජීවත් වෙනවා. ඒ වෙලාවට ඉතින් ට්‍රිනිටි නෙවෙයි. තව ඉතින් ටෙලිනාට්‍යයේ අධ්‍යක්ෂ මාමලා කියන විදයට එයාලගෙනුත් උපදෙස් අරගෙන මම රඟපානවා.

**පට්ටි ගෙදර පුංචි නන්දනී ගැන ගොඩ දෙනෙක් කතාවුණා?**

ඔව්. ඒ චරිතය ගැන තමයි හැමෝම කතා කළේ. දැන් නන්දනී චරිතය රඟපාන්නේ රෙබෙකා නැන්දා. මම එයාගේ ළමා කාලයට හිටියේ. රෙබෙකා නැන්දත් පුදුම වුණා මගේ රඟපෑම දැකලා. මම ගොඩක් ආශාවෙන් ඒ චරිතය රඟපෑවේ. මම හිතුවේ නැහැ මේ තරම් ප්‍රතිචාර මට ලැබේවි කියලා. මම රඟපාන හැම චරිතයකටම ගොඩ දෙනෙක් ආදරය කරනවා. ඉතින් මට ගොඩක් සතුටුයි. නැන්දලා මාමලාගේ ඒ ආදරය ලැබෙන කොට.

## රෙබෙකා නැන්දත් මගේ රඟපෑම දැකලා පුදුම වුණා...

**ලීසා ගැන කතා කළොත්?**

මම වරකත ටෙලිනාට්‍යයට සම්බන්ධ වෙන්නේ ගොඩක් ආශාවෙන්. නුවර ෂූටින් තියෙන්නේ. වලව්වේ චූටි මැණිකේ කෙනෙක්ගේ චරිතයක් තමයි මම රඟපාන්නේ. මගේ ලොකු අක්කට රඟපාන්නේ නිරෝෂා නැන්දා. මම එයාටත් ගොඩක් කැමැතියි. තව මායාලි එකේ මනමාලි නැන්දා. මේ හැමෝම මට ගොඩක් ආදරෙයි.

**ක්ෂේත්‍රයේ ප්‍රවීණ නැන්දලා මාමලාගෙන් ලැබෙන සහාය කොහොමද?**

මම රඟපාන හැම නිර්මාණයකම සියලු දෙනාගෙන් ලොකු සහායක් ලැබෙනවා. ඒ ආදරයටත් මම කැමැතියි. එතකොට රඟපාන්න වුණත් ලොකු පහසුවක් මට දැනෙනවා. ඒ හැමෝගෙම හුරතලී මම තමයි ඉතින්.

**හොඳට නටන්න පුළුවන් නේද?**

මම අවුරුදු පහේ ඉඳලා තමයි නැටුම් හදාරන්නේ. සමස්ත ලංකා තරගවලත් මම ජයග්‍රහණ ලබාගත්තා. ඔෂාන් ලියනගේ සර් යටතේ තමයි නැටුම් හදාරන්නේ.

**දුවට විදේශීය සිනමා නිර්මාණයක රඟපාන්න අවස්ථාව ලැබුණා. ඒ අත්දැකීම කොහොමද?**

චිත්‍රපටයේ අධ්‍යක්ෂ මාමා මාව වීඩියෝ එකක දැකලා තමයි මට කතා කළේ. 'කාස්ටික්' දෙමළ චිත්‍රපටයේ. විදේශීය ශිල්පීන් රැසක් කාස්ටික් චිත්‍රපටයේ



## කැමරාව ඉස්සරහට ගියාම මම ට්‍රිනිටි නෙවෙයි...

රඟපානවා. මම ඒ අය සමග ඉංග්‍රීසියෙන් තමයි කතා කළේ. මට ඩාන්සින් ඉගෙන ගන්න ඉන්දියාවට එන්න කියලා කතා කළා.

**අනාගත සැලසුම් කොහොමද ඔය පුංචි හිතේ?**

හොඳට ඉගෙනගෙන නැටුම් ගුරුවරියක් වෙන්න තමයි කැමැති. ඒ වගේම චරිතාංග රංගන ශිල්පිනියක් ලෙස රඟපාලා හොඳම නිළිය සම්මානයක් ගන්න ආසයි.

**වසන්ත විතාරණගේ**

---



## මගේ ටර්නින් පොයින්ට් එක ඉරාජ් අයියා...

## නන්දික සමරසිංහ

**'ක්ලියෝ පැට්‍රා අයියා' කිව්වම අද තරුණ පරපුරට අමුතු හැඳින්වීමක් අවශ්‍ය නැහැ. ඉරාජ් වීරරත්නගේ ජනප්‍රිය මියුසික් වීඩියෝවක් හරහා කතාබහට ලක්වූ ඔහු, රංගනයට පැමිණි දක්ෂ තරුණයෙක්. ජනප්‍රියත්වයට වඩා කලාවට ආදරය කරන ඔහුගේ ගමන, නව බලාපොරොත්තු හා අභියෝග රැසක් සමග තවමත් ඉදිරියට යන ගමනේදී අපි ඔහුව මෙසේ එකතු කරගන්න හිතුවා. ඔහු නමින් ක්ලියෝ නන්දික හෙවත් නන්දික සමරසිංහය.**

**නන්දික කියනවටද නැත්නම් ක්ලියෝ පැට්‍රා අයියා කියනවටද කැමැති?**

වැඩි දෙනෙක් මට කතා කරන්නේ ක්ලියෝ පැට්‍රා අයියා කියලා.

**ඔබට ක්ලියෝ පැට්‍රා නම හැදුණේ ගීතයක් නිසා නේද?**

ඔව්. ඉරාජ් අයියා කරපු ක්ලියෝ පැට්‍රා මියුසික් වීඩියෝව නිසා.

**මේ දවස්වල අලුත් වැඩකට සම්බන්ධ වුණේ නැද්ද?**

මගේම අලුත් වැඩක් සැලසුම් කරගෙන ඉන්නවා. ළඟදීම ඒකත් බලන්න පුළුවන්.

**ඔබ වැඩිහිටියන්ට පමණක් කියන ලේබලය ඇතුළේ චරිත නිරූපණයටද කැමැති?**

එහෙම නැහැ. වෙළෙඳ දැන්වීම්වල එහෙම රඟපෑවා. මම හොඳ නිර්මාණවලටත් දායකත්වය දීලා තියෙනවා.

**ඔබ නිරූපණ ශිල්පය හදාරපු කෙනෙක්? ඉන් පසුවද ඔබට රංගනයට අවස්ථාව ලැබුණේ?**

2013දී රොසෑන් ඩයස් මිස්ගේ මොඩ්ලින් ඇකඩමියෙන් තමයි මම මොඩ්ලින්වලට සම්බන්ධ වෙන්නේ. මම දැනටමත් ප්‍රවීණ නිරූපණ ශිල්පියෙක්. නමුත් රංගන ශිල්පියෙක් විදිහට මම ෆීල්ඩ් එකට ආවේ වෙළෙඳ දැන්වීමක ප්‍රධාන චරිතයක් හරහා.

**රඟපාපු මුල්ම වෙළෙඳ දැන්වීම මතකද?**

මන්චි කරි පෆ් ඇඩ් එකෙන් තමයි මම ෆීල්ඩ් එකට ආවේ.

## ජොබ් එක ටෙලිකොම් වුණාට ඉන්නේ ආට් එක ඇතුළේ...

# ඉරාජ් හින්දා හිට් වුණු ක්ලියෝ පැට්‍රා අයියා...



## මගේ ස්ටයිල් තාම ලැබුණේ එ





## එකට කෙනෙක් නැහැ...

**ඔබේ රැකියාව කලාව නෙමෙයි?**
මම රැකියාව විදිහට ටෙලිකොම් ඩිජිටල් ආයතනයේ සේවය කරනවා. නමුත් තාම මුල්තැන දෙන්නේ කලාවට.

**භාරගන්න චරිත නිසා ඔබේ ප්‍රතිරූපයට හානියක් නේද ?**
ටිකක් විතර එහෙම වුණා. නමුත් මම රංගන ශිල්පියෙක් විදිහට අභියෝග භාරගන්න කැමැතියි.

**මේ කතාබහේදි ඉරාජ් ප්‍රඩක්ෂන් ගැනත් ඔබට කියන්න දේවල් ඇති?**
මගේ ජීවිතේ හැරවුම් ලක්ෂ්‍යය ඉරාජ් අයියා සහ ඉරාජ් ප්‍රඩක්ෂන්. නළුවෙක් විදිහට මුළු රටේම තරුණ පරම්පරාව අතරට මාව රැගෙන ගියේ ඉරාජ් ප්‍රඩක්ෂන් ඔස්සේ තමයි.

**ඔබ කරන චරිත තරුණ තරුණියන් අතර ආන්දෝලනයකට පත්කරන චරිත. ඔබ එවන් චරිත තෝරාගන්නේ හිට් එකක් වෙන්න ඕනෙ නිසාද?**
ජනප්‍රියත්වයට තමයි අද කාලේ හැමෝම කැමැති. නමුත් එහෙම දෙයක් බලාගෙන නෙමෙයි මම රඟපෑවේ. නමුත් මට අදටත් ආදරය, ජනප්‍රියත්වය, පිළිගැනීම තරුණ පරම්පරාවෙන් ලැබෙනවා.

**මෙතෙක් සම්බන්ධ වූ නිර්මාණයන් ගැන මතක් කළොත්?**
ක්ලියෝ පැට්‍රා, ට්‍රේන් සෝන්ග් 2, බලා ඉන්නම් කල්ප කාලයක් , ෆිල්-ටී ගේ මල්ලි වැනි ගීත කිහිපයකම රඟපෑවා. මන්චි කරි පෆ්, ඩීමෝ බට්ටා, සිරස ලක්ෂපති, ආපිකෝ මෙට්ට වැනි වෙළෙඳ දැන්වීම්වලට රංගනයෙන් දායක වුණා. ලොක්කයියා, ඇන්ඩි කොම්පැනි, කන්තෝරු මෝරු, කාව්‍යා නාට්‍යයවල රඟපෑම් කළා.

**ඔබ අවිවාහකයි. විවාහ වෙන්න අදහසක් නැද්ද?**
මගේ ලයිෆ් ස්ටයිල් එකට සෙට් වෙන කෙනෙක් ලැබුණොත් මම අනිවාර්යයෙන්ම බඳිනවා. නමුත් තවම එහෙම හොඳ කෙනෙක් හම්බ වුණේ නැහැ.

**කලාව පැත්තෙන් තියෙන ලොකුම ඉලක්කය මොකක්ද?**
පුංචි තිරයේ මෙන්ම සිනමාවේ දක්ෂ රංගන ශිල්පියෙක් වෙන එක තමයි බලාපොරොත්තුව සහ මට සම්පූර්ණයෙන්ම කලාවට යොමුවෙන්න අදහසක් තියෙනවා. හදවත මල් යායයි චිත්‍රපටයේ මම ඇසිස්ටන්ට් ඩිරෙක්ටර් කෙනෙක් විදිහට කටයුතු කළා. ඉතින් ඒ පැත්තට යොමු වෙන්නත් අදහසක් තියෙනවා.

**ස්ටෙෆනි කොතලාවල**

> මම රංගන ශිල්පියෙක් විදිහට අභියෝග භාරගන්න කැමැතියි.

# වැඩේ හිතන තරම් ලේසි නැහැ...

## ශ්‍රීමාලි පුෂ්පිකා





**කලා ක්ෂේත්‍රයේ දවසින් දවස නව මුහුණු දකින්න ලැබෙනවා. මේ දිනවල ස්වර්ණවාහිනී නාලිකාවේ විකාශය වන ශිවගුරුනාදන් අධ්‍යක්ෂණය කරන ජහුටා නාට්‍යය ඔබ නැරඹුවා නම් නව මුහුණු කිහිපයක්ම දැකගන්න පුළුවන්. ඔවුන් අතරින් අද අපේ කතාබහට එකතු කරගත්තේ ශ්‍රීමාලි පුෂ්පිකායි.**

**මුලින්ම ශ්‍රීමාලි කියන්නේ කවුද කියලා කිව්වොත්?**
මම ශ්‍රීමාලි පුෂ්පිකා. හොරණ වරකාගොඩ තමයි මගේ ගම. මම විවාහ වෙලා ඉන්නේ. සැමියා නාවික හමුදාවේ. මට අවුරුදු හතක පුතෙක් ඉන්නවා. තිරයෙන් පිටුපස මම බිරිඳක්, මවක් මෙන්ම කැමරාව ඉස්සරහ මම සුළු චරිතවලට ජීවය දෙන අයෙක්. කලාවට පාසල් කාලයේ පටන් තිබූ ආසාව ආදරය නිසා තමයි මම කලාවට ආවේ.

**කලාවට මේ තරම් ඇල්මක් තියෙන ශ්‍රීමාලි, කලාවට යොමුවුණේ කොහොමද?**
පාසල් කාලයේ ඉඳන් මම වේදිකා නාට්‍යය කළා. පාසල් කාලයෙන් පස්සේ කලාවෙන් ටිකක් ඈත් වුණාට හිතේ තිබුණ ආසාව, ආදරය එක්ක වගකීම් අතරින් පාර හදාගෙන මම නැවත කලාවට ආවා. මගේ පළමුවැනි ටෙලිනාට්‍යය හිරු නාලිකාවේ විකාශය වුණු සිහින ගෙනෙන කුමාරි. සුජානි කියලා මගේ යාළුවෙක් සහ දිල්රුක්ෂි මිස් හරහා මට නිර්මාණ කිහිපයකම රඟපාන්න අවස්ථාව ලැබුණා. පොහොය නාට්‍ය, අවුරුදු නාට්‍ය, ඇත්තටම මම ඔයාට ආදරෙයි වගේ නිර්මාණ කිහිපයකටම සම්බන්ධ වුණා. පාසල් කාලයෙන් පස්සේ මෑතකදී මට නැවත වේදිකා නාට්‍ය දෙකකට සම්බන්ධ වෙන්න පුළුවන් වුණා. දෙගුරුවත, අප්පච්චි කියලා වේදිකා නාට්‍ය දෙකක දැනට රඟපෑම් සඳහා සම්බන්ධ වෙනවා.

**මේ දවස්වල සම්බන්ධ වෙලා තියෙන නිර්මාණ මොනවාද?**
ස්වර්ණවාහිනියේ ජහුටා නාට්‍ය, ස්වාධීන රූපවාහිනියේ ඉදිරියට විකාශය වන දෙවියන්ගේම පිහිටයි නාට්‍ය සහ ඉදිරියට 'පිස්සු' ෆිල්ම් එකට සම්බන්ධ වෙලා ඉන්නවා.

**ශිවගුරුනාදන් සහ සද්ධාමංගල සූරියබණ්ඩාර යන දෙදෙනාගේ නිර්මාණයකට සම්බන්ධ වීමට ලැබීම ගැන ඔබට දැනෙන්නේ මොන වගේ හැඟීමක්ද?**
දිල්රුක්ෂි මිස් හරහා තමයි මට ජහුටා නාට්‍ය සඳහා අවස්ථාව ලැබුණේ. ඇත්තටම මට ඒක සතුටක්. ජහුටා නාට්‍යයට සම්බන්ධ වීමෙන් මට ගොඩක් දේවල් ඉගෙනගන්න පුළුවන් වුණා. කලාවට තියෙන ආසාව තව තවත් වැඩි වුණා. සද්ධා සර්ගෙයි ශිවා සර්ගෙයි වැඩකට සම්බන්ධ වෙන්න ලැබුණ පළමු අවස්ථාව තමයි මේ.

**මුලින්ම කැමරාවකට මුහුණ දුන් දවසේ අත්දැකීම කොයි වගේද?**
මම මුලින්ම කැමරාවට මුහුණ දුන්නේ සිහින ගෙනෙන කුමාරි නාට්‍යයේ. කැමරාවට තනියම මුහුණ දෙන්න වුණේ නැහැ. තව පිරිසක් හිටපු නිසා සහ දෙබස් තිබුණේ නැති නිසා බයක් දැනුණේ නැහැ.

**රඟපාන එක හිතපු තරම් පහසුද?**
ටෙලි තිරයෙන් පේන තරම් රඟපෑම පහසු නෑ. එක විනාඩි 2ක සීන් එකක් පිටිපස්සේ පැය ගණන් මහන්සියක් තියෙනවා. රඟපෑම ඉගෙනගන්න ඕනෙ වැඩක්. අත්දැකීම්වලින් තමයි අපි ගොඩක් දුර යන්නේ. සුළු චරිතයක් වුණත්, ප්‍රධාන චරිතයක් වුණත් - රඟපෑම කියන්නේ හදවතින් කරන වැඩක්. හිතපු තරම් පහසු නෑ.

**මේ වෙද්දී කලාව විතරද කරන්නේ?**
මම ඔන්ලයින් රැකියාවක නිරත වෙනවා. ඒ අතරතුර තමයි රගපෑම් කටයුතුවලට සම්බන්ධ වෙන්නේ.

**ගෙදරින් ලැබෙන සහයෝගය?**
මම ෂූටින් ගියාම පුතාව බලාගන්නේ අම්මා. සැමියාගෙයි අම්මාගෙයි තේරුම් ගැනීම නැත්තම් මට මේ ගමන එන්න අමාරුයි.

**දිගටම ක්ෂේත්‍රයේ රැඳෙන්න කැමැතිද?**
ඔව්, මගෙ වගකීම් පවුල වෙනුවෙන් ලබාදෙන ගමන් කලාවට තියෙන ආදරය නිසා ජීවිතේ කෙළවර වෙනකල් කැමරාව ඉස්සරහා ඉන්න ආසයි.

**ප්‍රවීණයන්ගෙන් ලැබෙන සහයෝගය?**
ඔවුන්ගෙන් ලොකු සහයෝගයක් ලැබෙනවා. ඒ සහයෝගය පියාසර කරන්න ලැබෙන පියාපතක් වගේ. ඒ අයගෙන් ලැබෙන හැම උපදෙසක්ම අපේ ජීවිතේට පාඩමක්. ඒ අය තමයි අපේ ශක්තිය.

**ස්තුති කළ යුතු පිරිසක් ඇති?**
නම් වශයෙන් සඳහන් කරන්න බැරි තරම් පිරිසක් ඉන්නවා. මගේ පවුලේ අය සහ මට මේ තැනට එන්න උදව් කරපු හැම දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා.

**ස්ටෙෆනි කොතලාවල**

> මේක ඉගෙන ගන්න ඕන වැඩක්...

> ඒ සහයෝගය පියාසර කරන්න ලැබෙන පියාපතක් වගේ.

> විනාඩි 2ක සීන් එකක් කියන්නේ පැය ගානක මහන්සියක්...

# සීන් වලට නම් ආස නැහැ...

ටෙලි සිනමාව ඔස්සේ මෑත කාලයේ ජනප්‍රිය වූ අලුත්ම තරු අතර ඉන්න තවත් එක් නිළියක් ලෙස ප්‍රාර්ථනා සෙව්වන්දි හඳුන්වලා දෙන්න පුළුවන්. සිත්කලු රූ සපුවකට හිමිකම් කියන ප්‍රාර්ථනා කවමදාවත් නිළියක් වෙන්න හීන දැකපු කෙල්ලෙක් නෙවෙයි. හැබැයි වාසනාවට වාගේ නොහිතපු විදියට ඈ නිළියක් වෙනවා. සරල වාණිජ රැල්ලේ නිර්මාණවල වගේම ගුණාත්මක නිර්මාණවලටද නොසිතූ ලෙස ඇයට ඇරයුම් එනවා.

**මම ප්‍රේමය මුසු දර්ශන කරන විට සිපගැනීම් වැනි දේවල් ප්‍රතික්ෂේප කරනවා. අඩ නිරුවත් සීන්වලට කොහොමත් කැමැති නැහැ.**

ප්‍රාර්ථනා හැම මොහොතකම වාගේ කියන්නේ තමා ගැන දන්න අයට වඩා නොදන්න අය ඉන්නවා කියලයි. ඒ හින්දම ඔන්න අපට හිතුණා 'හාට්' එකේ පත්ඉරුවක ඈ ගැන පුංචි සටහනක් තියන්න.

**කොහොමද ප්‍රාර්ථනා ඉතින් ඔයාගේ සුව දුක් එහෙම?**

මම සතුටින් බොහොම සරලව ජීවතේ ගෙනියනවා.

**මොනවද මේ දවස්වල වෙන්නේ කියලා ඇහුවොත්?**

මේ දවස්වල මගේ ටෙලි ඩ්‍රාමා දෙකක්ම විකාශය වෙනවා. ඒ ඉරුගල් වලව්ව සහ තදලු සේයා යන ටෙලිනාට්‍යයි. ඒ දෙකේම ප්‍රධාන චරිත තමයි මට ලැබුණේ. ඊට අමතරව චිත්‍රපට දෙකකටම ආරාධනා ලැබිලා තියෙනවා.

**චිත්‍රපට දෙක ගැන පොඩි විස්තරයක් කියන්න පුළුවන්ද?**

ඒ ගැන නම් තවම එහෙමට යමක් කියන්න බැහැ. මොකද මට තවම එහි තිර පිටපතවත් ලැබිලා නැහැ. පිටපත බලලා තමයි මම ඒ චරිතය කරනවද නැද්ද කියලා තීරණය කරන්නේ. ඒ නිසා අපි වෙනත් දවසක ඒ ගැන කතාබහ කරමු.

**ඔබ බොහෝ විට චරිත තෝරන කෙනෙක්?**

ඔව්. මටය කියලා යම් සීමාවක් තියෙනවා. ඒ සීමාව තුළ ඉඳගෙනයි චරිත භාරගන්නේ.

**ඒ සීමා මොනවද කියනවා නම්?**

මම ප්‍රේමය මුසු දර්ශන කරන විට සිපගැනීම් වැනි දේවල්



# තාම කතා කරන්නේ පරණ ගානට...
## ගාන හරි නැත්නම් රිජෙක්ට් කරනවා...

සුපුරුදු සිනහවත්, දක්ෂතාවයත් නොවෙනස්ව රැකගෙන, කලකට පසු නැවතත් ඇය අපේ ආලින්දයට ඇවිත්. කලාවෙන් මඳ විරාමයක් ගත්තද, ප්‍රේක්ෂක හදවත්වල ඇයට තිබූ ආදරයේ නම් අඩුවක් නැහැ. රංගනය මෙන්ම ගායනයටත් එකසේ පෙම් බඳින මුතු තරංගා නම් වූ ඇය තම එකොළොස්වන සිනමා ආගමනය වන 'සූරිය සුළඟ' හි අමතක නොවන මතකයන් දෝතින් අරන් අප සමඟ හෘදයාංග මව දොඩමළු වූයේ මෙලෙසින්...

**ඉතින් මේ දවස්වල මොකද වෙන්නේ?**

'සූරිය සුළඟ එක්ක පොඩ්ඩක් කාර්යබහුල වෙලා ඉන්නවා. ඊට අමතරව 'ආලේ' නාට්‍යය විකාශය වෙනවා සහ ඒකේ රූපගත කිරීම් සිදුවෙනවා. ඒත් එක්කම පාටිවල ගායන කටයුතු සිදුකරන්න යනවා.

**කාලයක් නිහඬව හිටියේ ක්ෂේත්‍රයෙන් සමුගන්නද?**

පුතා හම්බුණාට පස්සේ මං අවුරුදු 5ක් විතර වැඩ කළේ නෑ. ඊට පස්සේ තමා නැවත වැඩ කරන්න ගත්තේ. මුලින්ම භාරගත්තේ 'ආලේ' ටෙලිනාට්‍යය තමයි. පුතා නිසා කෙටි විවේකයක් ගත්තත් දැන් නැවත රංගනය සිදුකරනවා.

**ගායන වැඩකටයුතු කොහොමද ඉදිරියට?**

සංචාර කිහිපයකට කතා කරලා තියෙනවා. ඉස්සර වගේ සංගීත සංදර්ශනවලට නම් යනවා අඩුයි දැන්. ඉඳලා හිටලා යනවා. ටීවී වැඩසටහන්වලට ගියාම සිං කරනවා.

**ඔබ නිර්මාණ භාරගැනීමේදී තෝරාබේරා ගැනීමක් සිදුකරනවාද?**

මම ක්ෂේත්‍රයට එන කාලේ මං එහෙම තෝරාබේරා ගැනීමක් කළේ නෑ. හැබැයි දැන් ටිකක් බලනවා. හොඳ නිර්මාණ වුණත් මූල්‍යමය තත්ත්වය පොඩ්ඩක් බලනවා දැන්. හොඳ නිර්මාණයක් වුණත් නිසි වටිනාකම ලැබෙන්නේ නැත්තම් ප්‍රතික්ෂේප කරන්න සිදුවෙනවා. තාම 2005,2008 ගණන්වලට කතා කරනවා. හැම දේම වැඩිවෙලා තිබුණත් රංගන ශිල්පීන්ගේ මිල විතරක් පරණ විදිහටම තියෙනවා. ඒ නිසා වටිනාකම හරියටම බලනවා මං වැඩක් භාරගද්දී.

**ඔබට වැඩිපුරම ප්‍රේක්ෂක ආදරය ලැබුණු නිර්මාණය මතක් කළොත්?**

වසුදා එකේ ශාලිකා කියන චරිතයෙන් තමයි මාව ගොඩක් අඳුරගත්තේ. ඊට පස්සේ මං ගොඩක් නාට්‍යවල ප්‍රධාන චරිත කළේ. ඒ හැම එකක්ම වගේ ප්‍රේක්ෂකයන්ට මතකයි. අදටත් චරිතයේ නමින් කතා කරනවා සමහරු. 'සිදංග නා' ටෙලිනාට්‍යයේ සඳපානි කියලත් කතා කළා. තාමත් ඒ නිර්මාණය බලන්න පුළුවන් විදිහක් අහනවා.

**ඔබ රංගන කටයුතු සිදු නොකළා නම් අද කවුද?**

ඇත්තටම මං හරි ආසාවෙන් හිටියේ ගායන කටයුතුවලට. සංගීත් නිපුන් පී.වී. නන්දසිරි සර් යටතේ තමයි මං සංගීතය හැදෑරුවේ. සර් නැති වුණාට පස්සේ මං ගායන කටයුතු ඉගෙන ගැනීම නතර කළා. ඊට අමතරව චන්න විජේවර්ධනයන් ගාව නර්තනයත් හදාරලා තියෙනවා මම. රංගනය සිදු නොකළා නම් මං ගායිකාවක් වෙයි කියලා හිතනවා.

**ඔබ 'සූරිය සුළඟ'ට සම්බන්ධ වෙන්නේ කොහොමද?**

'සූරිය සළඟ'ට මට කතා කරන්නේ ඩොනල්ඩ් ජයන්ත මහත්මයා සහ ප්‍රියන්ත කොළඹගේ මහත්මයායි. මීට කලින් මම ප්‍රියන්ත කොළඹගේ අයියාගේ මන්දාරා එකේ මේඝගේ මවට රඟපෑවා. මේ පාර මේඝගේ අක්කා හැටියට රඟපානවා. මට ප්‍රියන්ත අයියා ගොඩක් ඉස්සර හම්බෙලා තියෙනවා මං වෙළෙඳ දැන්වීම්වල රඟපාන කාලේ. ගොඩක් සතුටුයි කාලෙකට පස්සේ මාව මතක් වීම ගැන. මේක මගේ 11 වැනි සිනමා නිර්මාණය. ඒකත් මට ලොකු භාග්‍යයක්.

**සතුටුයි කාලෙකට පස්සේ මාව මතක් වීම ගැන. මේක මගේ 11 වැනි සිනමා නිර්මාණය.**

**එහි රූගත කිරීම්වල අමතක නොවන සිදුවීම් මොනවාද?**

තාත්තා නැතිවෙන සිදුවීම අමතක කරන්න බෑ. ඒක තාම දැනෙනවා. ඒත් එක්කම තාත්තගේ අවසන් කටයුතු කරන්න කනත්තට ගිහින් ඉන්නකොට මල්ලි එතැනට එනවා. එතකොට මිනී පෙට්ටිය තියලා තිබ්බේ පොඩි පල්ලමක් වගේ තැනක. මේඝ අත තිබ්බ ගමන් ඒක කඩාගෙන පහළට වැටුණා. අපේ තාත්තට හිටියේ ටෙරී අංකල්. අපි හැමෝම බය වුණා ඔහුට මොනවා හරි වුණාද කියලත්. ඒක අමතක නොවන සිදුවීමක්. ඒත් එක්කම අවුරුදු ගානක් ගිහිල්ලා පළවෙනි පාරට මං රංගන කටයුත්තකට පුතා එක්ක ගියා. මේක්-අප් කළේ පුතාව ඔඩොක්කුවේ තියාගෙන. ඒක මට අමතක නොවනම සිදුවීමක්.

**මේ නිර්මාණය ඔබට ප්‍රේක්ෂකයෙක් විදිහට බලද්දී දැනුණේ කොහොමද?**

අපේ ජීවිතයේ අපි හොඳට ඉන්නවා, එකපාරට මොනවා වෙයිද දන්නේ නෑ. අපි හැමෝටම හොඳ කරනවා. ඒකෙන් අපිට ලැබෙන්නේ මොනවද කියලා බලාපොරොත්තු වෙන්නේ නෑ. එහෙම කරලා අමාරුවේ වැටුණු දෙයක් තමයි වෙන්නේ. ඉතින් මං ප්‍රේක්ෂකයන්ගෙනුත් ඉල්ලනවා මේ චිත්‍රපටය බලන්න අපේ ජීවිතයටත් මේ වගේ දේවල් නොවෙන්න වගබලාගන්න කියලා.

**ඔබගේ ඉදිරි වැඩකටයුතු ගැන මතක් කළොත්?**

නිර්මාණ කිහිපයක් ආවා. නොගැළපෙන ඒවා අයින් කළා. ඊට අමතරව 'ආලේ' එකෙන් පස්සේ 'පාටකුරුල්ලෝ' රචනා කරන බුද්ධික සේමසිංහගේ නාට්‍යයකට සම්බන්ධ වෙලා ඉන්නවා. ඒකත් ඉදිරියට බලාගන්න පුළුවන්. ඒකත් වෙනස්ම ලස්සනම කතාවක් වෙයි. ප්‍රේක්ෂකයන්ගෙන් ඉල්ලනවා 'සූරිය සුළඟ' බලන්න 'ආලේ' සමග රැඳී ඉන්න කියලත්.

සටහන සහ ඡායාරූප
**කල්ප මේනක පීරිස්**

මුතු තරංගා



පසුගිය දිනවල අපි 'කොටු' හරහා කො[...] කිහිප දෙනකුගේ හපන්කම් ගැන ඔබ[...] මම අද ඔබට හඳුන්වා දෙන්නේ කො[...] බේරුණු තවත් දක්ෂ රංගන ශිල්පි[...] ගැනයි. සුලෝචනා හැරපත්දෙණිය[...] පරපුරේ සිටින තවත් දක්ෂ රංග[...] ශිල්පිනියක්. ඇය මේ වනවිට ([...] රංගනයෙන්ද සිනමා නිර්මාණ [...] ඔබට සමීප වී සිටිනවා. සින[...] දිගු ගමනකට මුලපුරා සිටි[...] සුලෝචනා සමගයි 'හාට්' මේ කතාබහ.

කොටු වු[...]
ඇයි කිය[...]
හිතාග[...]
බැහ[...]

ටුවුණු ශිල්පීන්
ට හෙළි කළා.
ටුවෙන්
නියක්
ා නව
න
ටෙලිනාට්‍ය
හරහාද
මාවේ
න
අපේ



# අතහැරියොත් සඳහටම මම අතහරිනවා...

## සුලෝචනා හේරත්දෙනිය

**සුලෝ ඉතින් කොහොමද?**

මේ දිනවල කලා කටයුතුවලටත් සම්බන්ධ වෙමින් පවුලේ වැඩකටයුතුත් කරමින් සතුටින් ඉන්නවා.

**මොකද්ද මේ ඉපැරැණි කතාව?**

'පෙම්වතිය' ටෙලිනාට්‍යයේ යෙහාලි චරිතය තමයි මම රඟපාන්නේ. 'මගේ ඉපැරැණි පෙම්වතිය' කතාව තුළ දෙපැත්තක් තියෙනවා. ඒ ගැන ලොකුවට දෙයක් මේ වෙලාවේ මට සඳහන් කරන්න අමාරුයි.

**එහෙම ආදරණීය නමක් සඳහන් වෙනකොට ඉපැරැණි පෙම්වතා මතක් වෙනවා ඇති?**

අපෝ කවදාවත්ම නැහැ. මම ඉතින් අතහැරියොත් සඳහටම අතාරිනවා. මට දැන් අවුරුදු දෙකක බබෙක් ඉන්නවා.

**සුලෝගේ ගම්පළාත කොහොමද?**

මගේ ගම්පළාත රත්මලාන. පසුකාලීනව මම නාත්තන්ඩියට ගිහින් හිටියා. දැන් ඉන්නේ කොළඹ.

**මේ දිනවල දේවි ගැන කතාවෙනවා?**

ප්‍රතිචාර නම් හොඳයි. මම පුබුදු ගමගේගේ බිරිඳ ලෙස රඟපාන්නේ. ගමක කෙනෙක් අඳින පලඳින ඇඳුමෙන් පවා වෙනස්. දේවි චරිතය ඉදිරියේදී හොඳ විදියට ගලාගෙන යයි කියලා මම හිතනවා. කොටු ටෙලිනාට්‍යයේ මිහිරි චරිතයට වඩා ලොකු වෙනසක්. දේවි චරිතය සාමාන්‍ය ජීවිතයේ කිසිම අත්දැකීමක් නැහැ.

**මිහිරිට කොටුවක් පැනගන්න බැරි වුණා නේද?**

මම හිතන්නේ කොටු එකේ කොටුවක් පැනපු නැතිම කෙනා මම වෙන්නැති. අසංක සායක්කාර අයියගේ රංගන වැඩමුළුවට සම්බන්ධ වුණා. ඒ හරහා තමයි කොටු ටෙලිනාට්‍යයට සම්බන්ධ වෙන්නේ.

> මම පුබුදු ගමගේගේ බිරිඳ ලෙස රඟපාන්නේ. ගමක කෙනෙක් අඳින පලඳින ඇඳුමෙන් පවා වෙනස්.

**සුලෝගෙ සැමියාත් කලාවට සම්බන්ධ කෙනෙක් නිසා මේ ගමන යන්න ලොකු පහසුවක් ඇති?**

ඇත්තටම ඔව්. මගේ දක්ෂතාවට ඉඩ දෙන කෙනෙක්. ඔහු මේ වනවිට වෙළෙඳ දැන්වීම් සඳහා ඇඳුම් නිර්මාණය කරන ශිල්පියෙක් ලෙස කටයුතු කරනවා. ඔහු මගේ වැඩකටයුතු බලලා අඩුපාඩුවක් තිබුණොත් මට කියනවා. මගේ පැත්තෙන් යන්න උපරිම නිදහස දීලා තියෙන්නේ. මාව කිසිම තනි රාමුවකට කොටු කරගෙන නැහැ.

**'හියුමන් එරර්' හරහා තමයි ඔබගේ මුල්ම දායකත්වය?**

සුපුන් රත්නායකගේ ටෙලිනාට්‍යයක් තමයි හියුමන් එරර්. මම ඒ කතාවේ රඟපෑවේ දේවිගේ චරිතය.

දේවි චරිතය ලොකු වෙනසක් දැනුණා. නුවරඑළියේ දමිළ පිරිමියෙක්ගේ සිංහල බිරිඳකගේ චරිතයක් තමයි රඟපෑවේ. ඒ චරිතය තුළදී ලොකු වෙනසක් දැනුණා. හැබැයි ඒ චරිතයට එහා ගිය ලොකු වෙනසක් දැනෙන මගේ ස්වරූපය පවා වෙනස් වෙන විදියේ චරිතයක් රඟපාන්න ගොඩක් ආශාවෙන් ඉන්නවා.

**ඔබේ කුලුඳුල් සිනමා නිර්මාණය කොටුද?**

නෑ. චමින්ද ඉලුක්වෙලගේ මාගම් සෝලිය, ජගත් ආනන්දගේ යකඩ මනමාලි, චන්ද්‍රරත්න මාපිටිගමගේගේ දණ නමන හද. පස්සේ තමයි අසංක සායක්කාරගේ කොටු සිනමා නිර්මාණය. මේ සියලු චිත්‍රපට හරහා ඉදිරියේදී මාව දැකගන්න පුළුවන්.

**වසන්ත විතාරණගේ**

# කොටුවක් පැනපු නැති එකම කෙනා මම..



ණේ
ලා
න්න
ැ



ප්‍රතික්ෂේප කරනවා. අඩ නිරුවත් සීන්වලට කොහොමත් කැමැති නැහැ. හුඟක් දුර පළාත්වල රූගතකිරීම් වැටෙනවා නම් ඒ ගැනත් පාඩුවක් හිතන්න වෙනවා. ඔන්න ඔවැනි සීමා ගැන තමයි කියන්නේ.

**නවක නිළියක ලෙස එවැනි සීමාවක් තුළ ඔබට සාර්ථක ගමනක් යන්න පුළුවන් වෙයිද?**

හැමෝම කපාගෙන ඉදිරියට යන්න ලංකාවේ ජනප්‍රියම නිළිය වෙන්න මම හීන දකින්නේ නැහැ. නාට්‍ය ගොඩක් එකපාර බදාගන්න හෝ හැමදාම ටීවී එකේ පෙනීසිටින්න මට වුවමනාවකුත් නැහැ. අන්න ඒ හින්දා මා විසින්ම තනාගත් සීමාවන් තුළ මා ගෙනයන ප්‍රතිපත්ති වෙනස් කරන්න මම කැමැති නැහැ. නාට්‍ය ගොඩක් අහිමි වෙන නිසා මම කවදාවත් මගේ අනන්‍යතාවට හානි කරගන්නෙත් නැහැ.

**ඉහත සීමාවන් තුළ ඔබට අහිමිව ගිය ටෙලි නිර්මාණ තියෙනවද?**

ඔව්. ගුණාත්මක වගේම වාණිජ රැල්ලේ සරල නිර්මාණද මට අහිමි වී ගිය අවස්ථාවන් තියෙනවා. හැබැයි ඒ අහිමිවීම් ගැන මට දුකක් නැහැ. මොකද කියනවා නම් මම ප්‍රතිපත්තිගරුක කෙනෙක්. ඒ මගේ අම්මයි තාත්තයි මාව හදපු විදිය. ඒ අභිමානය නැති කරගන්න මම කවදාවත් උත්සාහ කරන්නේ නැහැ.

**ඔබ රංගනයට ආපු විදිය ගැන කියනවා නම්?**

මගේ හිතේ හීනයක් තිබුණේ නැතුවට මගේ අම්මයි තාත්තයි ආශාවෙන් හිටියා මම නිළියක් වෙනවට. ඒ අතරේ තමයි මම 2019 අවුරුද්දේ මිස් ශ්‍රී ලංකා තරගයට සහභාගි වෙන්නේ. එතැනදී ජයග්‍රහණ හතරකට මම හිමිකම් කියනවා. ඒ ඔස්සේ තමයි මට රංගනයට ආරාධනා ලැබෙන්නේ. මෙහිදී මට අතහිත දුන්න පිරිස අතර තිළිණි පෙරේරා රංගනවේදිනියට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

**ඔබේ පළමු ටෙලි නිර්මාණය රාවණා?**

නැහැ. මගේ පළමු ටෙලි නිර්මාණය සිද්ධාර්ථ ගෞතම. හැබැයි ප්‍රේක්ෂකයන් අතරට මම ආවේ සහ මාව ඔවුන් හඳුනාගත්තේ රාවණා ටෙලි නිර්මාණය හරහායි.

**ඔබ බොහොම ලැජ්ජාශීලී චරිතයක් කියලයි අහන්න ලැබුණේ?**

ඔව්. පුංචි කාලේ මම හරිම කුලෑටි කෙල්ලෙක්. ඉස්කෝලේ යන දවස්වලත් එහෙමයි. ඒ දවස්වල ඉගෙන ගන්න කාලේ ටෙලිනාට්‍යයක් රූගත කරන්න අපේ ඉස්ලෝකෙට ආව ටෙලි ශිල්පීන් පිරිසක් ටෙලිනාට්‍යයක ප්‍රධාන චරිතයකට මට කතා කළා. මතක හැටියට මම උසස් පෙළ කරනවා. බටහිර තූර්ය වාදක කණ්ඩායමේ පුහුණුවීම් කරන අතර තමයි එයාලා මාව දැකලා තිබුණේ. ලැජ්ජාවක් හිතට දැනුණු නිසයි එදා ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ.

> පුහුණුවීම් කරන අතර තමයි එයාලා මාව දැකලා තිබුණේ.

**සිද්ධාර්ථ ගෞතම නාට්‍යයෙන් පසු දිගින් දිගටම ඔබට ලැබුණේ ඒ වගේම චරිත?**

ඔව්. මාව දිගින් දිගටම වගේ රජ කතා චරිත සමග කොටු වුණා.

**කුමාරියක් වගේ ලස්සන පෙනුම නිසා එහෙම වුණා වෙන්න බැරිද?**

අනේ මන්දා. හිතාගන්න බැහැ ඒ කොටුවීම සිදුවුණේ මොන හේතුවක් නිසාද කියලා. කොහොමත් බොහෝ කලා ශිල්පීන් එවැනි දේට මුහුණ දුන් බව අහලා තියෙනවා.

**හෙට දවස ගැන ඔබේ බලාපොරොත්තු?**

මම යන්නේ හෙමින් ගමනක්.

රංගනය ගැන ඉහළට හදාරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අතර රජ චරිත රටාවෙන් මිදුණු වෙනස්ම චරිත රංගනයක යෙදෙන මගේ අලුත්ම ටෙලිය එනතුරු මම බලාගෙන ඉන්නවා. රහස් පරීක්ෂකවරියක ලෙස මා එහි නියැළෙන චරිත රංගනයට මම හුඟක් ඇලුම් කරනවා. ප්‍රේක්ෂකයන්ට එය ලොකු වෙනසක් වෙන බව විශ්වාසයි.

**මල්මි කෞෂල්‍යා**

හැමෝටම හොඳ කරලා අන්තිමට අමාරුවෙ වැටෙනවා...



# අහිමිවීම් ගැන දුකක් නැහැ...



දේදුන්නෙන් පාට අරන් ආපු ආදරය අදටත් විඳින

# පුංචි තිරයේ ආදරණීය අම්මා

ඉන්දිකා සුබසිංහ

## මගේ ජීවිතේ ඇරියස් නැහැ...

**ගෙදර බුදුන් අම්මා... ඇය හැමදාම පැතුවේ පවුලේ සතුට සැනසීම පමණයි. ඈ මුළු නිවසටම ආලෝකයක්. අද ඔබට කියන්න හදන්නේ ඒ වගේ අම්මා කෙනෙක් ගැන. ඇය ඉන්දිකා සුබසිංහ. ඉන්දිකා මේ වනවිට ටෙලිනාට්‍ය රැ සකම මවක් වී හමාරයි. ඒ තරමට පුංචි තිරයට නැතුවම බැරි මවක්. මේ දිනවල 'සංගීතේ', 'සිහිනෙක තනිවෙලා' ටෙලිවල එකිනෙකට වෙනස් පැතිකඩ දෙකක චරිතවලට ජීවය දෙන ඇය සමගයි 'හාට්' අපේ අද කතාබහ.**

'අම්මා' එහෙම කියද්දිම හදවතට මාරම විදියට දැනෙනවා. ප්‍රේක්ෂක ජනතාවගේ අම්මා වීම සතුටුදායකයි. ආදරෙයි ඒ ආදරණීය පිළිගැනීමට.

**'කෝ ජයේ' කොහොමද ඒ අම්මා?**

ජයේ සිහිනෙක තනිවෙලා මේ දවස්වල. දමයන්ති ගැන කතා කරන්න වචන නැති තරම්. ඒ තරමට මම දමයන්ති චරිතයට ඒ පවුලට පුදුම ආදරයක් තියෙන්නේ. දමයන්ති චරිතයේ ගතිපැවතුම් හරියට මගේ අම්මාගේ ගතිපැවතුම් හා සමානයි. ඒ තරමට දමයන්ති මගේ ජීවිතයේ කොටසක් වී හමාරයි. මම නිවීසැනසිල්ලේ කතාකරන හැසිරෙන එකම චරිතය දමයන්ති චරිතය වෙන්න ඇති. මගේ ඇඟටමත් නොදැනී දමයන්ති තුළ මම ජීවත් වෙනවා. ප්‍රේක්ෂක ආදරය උපරිමයෙන් විඳිනවා දමයන්ති නිසා.

**හැබැයි තවත් පැත්තකින් හොඳ දෙස්දෙවොල් එනවා?**

අම්මෝ ඒ තරමට සංගීතේ ටෙලිනාට්‍යයේ සේමිණි චරිතයට හොඳ හොඳ ආමන්ත්‍රණවලින් මුලදී ප්‍රතිචාර ආවා. පාරක බැහැලා යන්න බැරි තරමට. මම ඉතින් තිර පිටපතට චරිතයට උපරිම සාධාරණයක් කරනවා. ඒ නිසා ප්‍රේක්ෂකයන්ට ඒ තරමට චරිතය දැනිලා. දමයන්ති සහ සේමිනි චරිත මට අහසයි පොළොවයි වගේ. හැබැයි දැන්නම් දමයන්තිට තියෙන ආදරය වැඩිකමට ඒ තරමට මට බණිනවා අඩුයි. සේමිනි චරිතයට මගේ දුව වුණත් කැමැති නැති තරම්. සේමිණි චරිතය වෙනුවෙන් ප්‍රේක්ෂකයන් දාලා තිබුණු කමෙන්ට්ස් දැක්කම මමත් ගොඩක් බය වුණා.

**ඒ ප්‍රතිචාරවලට කොහොමද ඔබ ප්‍රතිචාර දැක්වූයේ?**

ඒ ගැන කතා කරන්න ගියොත් පත්තරේ පිරෙන්නම කතා කරන්න පුළුවන්. කෙටියෙන්ම කිව්වොත් පාරක බැහැලා යන්න බැරි තරමට මාව පෙන්නන්න බැරි තරම්. හිතාග න්න පුළුවන්නේ කොයි වගේද කියලා ප්‍රතිචාර. සතුටුයි ඉතින් ඒ තරමට දැනිලා සේමිණිව.

**ඔබේ පෙනුමට ලැබෙන චරිත අඩුයි නේද?**

හොඳම ප්‍රශ්නයක්. සමහර චරිතවලට මාව තෝරාගන්නවා. මගේ රඟපෑම, වොයිස් එක හොඳයි කියනවා. හැබැයි මගේ බාහිර පෙනුම ගැළපෙන්නේ නැහැ කියලා මාව ප්‍රතික්ෂේප වෙන අවස්ථාත් තියෙනවා. මම එක්ක රඟපාන නළුවාට මගේ පෙනුම ගැළපෙන්නේ නැහැලු. චරිත් අබේසිංහ අධ්‍යක්ෂණය කරපු බඹරෙක් ඇවිත් ටෙලිනාට්‍යයේ මම රඟපෑවා. චරිත් අබේසිංහ තමයි මගෙ පුතාට රඟපෑවේ.

මාව සම්පූර්ණයෙන්ම වේශ නිරූපණයෙන් ඒ චරිතය වෙනුවෙන් වෙනස් කළා. මමත් කැමැති මගේ පෙනුමට එහා ගිය වයසක චරිතයක් වුණත් රඟපාන්න. මම කැමැති නැහැ චරිත තෝරාගැනීමේදී මගේ බාහිර පෙනුම අදාළ කරගන්නවට. ඕනෑම චරිතයක් මම රඟපාන්න සූදානම්.

> **අපි දෙයක් කරනවා නම් එයට වටිනාකමක් අනිවාර්යයෙන් තියෙන්න ඕනේ.**

**චරිත ස්වභාවයට ඉන්දිකාගේ පැකේජ් එක වෙනස් වෙනවද?**

අපි දෙයක් කරනවා නම් එයට වටිනාකමක් අනිවාර්යයෙන් තියෙන්න ඕනේ. නිකම් කරන්නම් වාලේ කරලා වැඩක් නැහැ. මටත් දැනෙන හොඳ නිර්මාණයක චරිතයක් නම් මම මුදල ගැන ලොකුවට හිතන්නේ නැහැ. මමත් උපරිම මහන්සි වෙලා වැඩ කරනවා.

**සෙට් එක තුළදී ආදරණීය යෙහෙළියක් කියන්නේ ඇත්තද?**

එදිනෙදා වැඩවලදී හමුවෙන හැම කෙනාටම මම ආදරණීය කෙනෙක්. මිනිස්සුන්ගේ ගැඹුර මම හොයන්න යන්නේ නැහැ. ඒ දේවල් මට අදාළත් නැහැ. මගේ හිත නිදහස්. මගේ හොඳම යාළුවා මගේ සැමියා. මේ ෆීල්ඩ් එකේදි මම ගරු කරන්න ඕනෙ කෙනාට ගරු කරනවා. මගේ ජීවිතයේ ඇරියස් නැහැ. මම පවුලේ අයත් එක්ක සතුටින් කාලය ගතකරන කෙනෙක්. ආදරයේදී උපරිම ආදරය කරන්න කියලා මගේ දරුවන්ට වුණත් මම කියන්නේ. මට එක රැ යකින් ජනප්‍රිය වීමේ වුවමනාවක් නැහැ. හෙමින් මේ ගමන ඇවිල්ලා සැනසිල්ලේ හිනාවෙලා ඉන්න පුළුවන් ගමනක් මට තියෙන්නේ. අද මම මේ ඉන්න තැන ගැන මම සතුටු වෙනවා. ඒ සතුට හැමෝම එක්ක සුහදව බෙදාගෙන වැඩකටයුතු කරන අම්මා කෙනෙක්. තවත් විටෙක යෙහෙළියක්.

**ගැටිස්සි කාලේ ආදර බැල්ම තියෙන්න ඇති නේද කොල්ලන්ගේ?**

අම්මෝ... ඔව්. ඒ තරමට ආදරය ලැබුණු කාලයක් තමයි. මට මගේ පෙම්වතා හමුවෙන්නේ දේදුන්නෙන් පාට අරන් ටෙලිනාට්‍යයේ. ඔහු නිලංක පිශේරා. ඔහු නිෂ්පාදකවරයෙක්. එතැනින් පටන්ගත්ත ඒ ආදරය අදටත් මම විඳිනවා. අපි දෙන්නටම දුවෙකුයි පුතෙකුයි ඉන්නවා. මගේ පුතා කලිඳු පිශෙ 'රා. ඔහුත් කුඩා කාලේ වෙළෙඳ දැන්වීම්වලට සම්බන්ධ වුණා. මගේ දුව ලෙහන්සා පිශෙ 'රා. මේ වගේ සැමියෙකුගෙනුයි දරුවන්ගෙනුයි ආදරය ලබන්න මම වාසනාවන්තයි. මගේ ලෝකය මගේ පවුල. මේ ආදරය තමයි මම දැන් විඳින්නේ.



වසන්ත විතාරණගේ

**අනුන්ගේ දිග පළල මට අදාළ නැහැ...**

දැහැනට සමවදින

# රජ දහන එයි...

**සමාජයේ අසන්නට සහ දකින්නට ලැබෙන පිය-පුතු සෙනෙහස ගැන කියැවෙන ඉතා අනුවේදනීය එමෙන්ම අපූරු කතාවක් රැගත් නවතම සිංහල සිනමා නිර්මාණයක් ජුනි 19 වැනිදා සිට රිදී තිරයේ දිගහැරෙයි.**

'රජදහන' නමින් එළිදැක්වෙන මෙම චිත්‍රපටය අධ්‍යක්ෂණය කර ඇත්තේ ප්‍රවීණ ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයකු වන වාසිත සමරනායක විසිනි. ඔහු පසුගිය කාලයේ සිනමා නිර්මාණවලටද තම දායකත්වය සපයා ඇති දක්ෂ නිර්මාණ ශිල්පියකු වෙයි. ඔහු තම නව සිනමා නිර්මාණය සම්භාව්‍ය ආකාරයකින් නිම කිරීමට බොහෝ වෙහෙසක් දරා ඇත. මෙම සිනමා නිර්මාණයෙහි පියාගේ චරිතයට නවක රංගන ශිල්පී ජගත් ගලප්පත්ති පණපොවන අතර, පුතුගේ චරිතයට නව පරපුරේ තරුණ රංගන ශිල්පී අමිල කරුණානායක පණපොවයි. ප්‍රධාන නිළි චරිතය නතාෂා හතරසිංහ විසින් රඟදක්වයි. ඔවුනට අමතරව ඩග්ලස් රණසිංහ, නිරෝෂා තලගල සහ තවත් රංගන ශිල්පීන් දායක වෙති.

මෙම චිත්‍රපටයේ තවත් සුවිශේෂ කරුණක් වන්නේ සංගීත අධ්‍යක්ෂණය විශාරද එඩ්වඩ් ජයකොඩි විසින්ද, ගීත ගායනය විශාරද අමරසිරි පීරිස් සහ විශාරද එඩ්වඩ් ජයකොඩි විසින්ද සිදුකර තිබීමය. 'රජදහන' 'සේනාධී ෆිල්ම්ස්' නිෂ්පාදනයකි.




**ප්‍රියන්ත හෙට්ටිගේ**

මව්රට දැන් ඉරිදා 2026 ජුනි 21

කේන්දරේ

ගලපන ගැලපෙන තැන...



ඇස්වහ කටවහ සතුරු උවදුරු මවන

# ජීවිතයේ පතුලම පීරන ගුප්ත සෙවණැල්ල කේතු

**උඩුකය මනුෂ්‍ය රුවකි. එහෙත් යටිකය දෙස බැලූ කල පෙනෙන්නේ වෙළී ගිය නාග දරණයකි. ඔහු නෙලුම් මලක් මත අසුන්ගෙන සිටියි. දෑතේ පොතකි. ඔහු නිතරම කියවන්නේ අනාගතය ගැන ද, නැතහොත් තමාගේම අතීතය ගැන ද? ඔහුට ඇවිදින්නට බැරිය. දෙපා පුරාම තුවාලය. ඔහු දන්නා දේ බොහෝය. ඔහු නුවණින් පිරිපුන්ය. එහෙත් ඒ ඇස් දෙස බැලූ විට පෙනෙන්නේ මුළු මහත් විශ්වයම එපා වූ, ජීවිතය ගැන පමණක් නොව තමා ගැනම කලකිරුණු අසරණ මිනිසෙකි. මේ පින්තූරය කේතු ග්‍රහයාගේය. ඔබ කවදා හෝ කල්පනා කර තිබේද, ඔබේ කේන්දරයේ කේතු බලවත් වූ කල, මේ කේතුගේ ස්වභාවය හරියටම ඔබේ ජීවිතයට ද ආරූඪ වන්නේ මන්දැයි කියා?**

කේතු යනු අහසේ පාවෙන අන් ග්‍රහයන් මෙන් පෙනෙන තාරකාවක් නොවේ. ඔහු ගණිතමය ලක්ෂ්‍යයකි. ඔහු එක්තරා බලවේගයකි. කේතු දශාවක් ඔබේ ජීවිතයට එළඹෙන්නේ අහම්බයකින් නොවේ. ඒ පැමිණීම ඔබේ දේහයේ රුධිරයට පවා දැනෙන්නට පටන් ගනී. නිතර නිතර උණ රෝගය හිස ඔසවයි. සම මත මතු වන දද, කුෂ්ඨ, හොරි හෝ සුව නොවන තුවාල මගින් කේතු ඔබට යමක් කියන්නට උත්සාහ කරයි. බඩේ පවතින අස්වාභාවික වියළි බව ඔබේ සිරුරේ අභ්‍යන්තරය කා දමන විට, පිටතින් සතුරු උවදුරු, ඇස්වහ, කටවහ වැනි නොපෙනෙන බාධක දොරට තට්ටු කරන්නට පටන් ගනී. ධන හානි වේ. ඔබ දැරූ තනතුරුවලින් පහත වැටීම නිසා මුළු ලොවම ඔබ දෙස බලන්නේ පරිහානියට පත් වූවෙකු ලෙසය.

එහෙත් මේ ගුප්ත ග්‍රහයා තුළ ඇත්තේ එකම පැත්තක් පමණක් නොවේ. කේතු සුබ වූ කල ඔහු දෙන්නා වූ ඵලය අසිරිමත්ය. ඔහු ඔබේ ජීවිතයට දූදරුවන්ගේ ආලෝකය ගෙන එයි. වස්තුව සහ යාන වාහන ඔබ වෙතටම ඇදී එයි. ඔබ තුළ ගුප්ත ආගමික භක්තියක් උපදවයි. සමහර විට ඔබ එක මොහොතකදී අධික භක්තිමත් කෙනෙකු වන්නටත්, තවත් මොහොතකදී අන්ධ භක්තියේ ගිලෙන්නටත් ඉඩ ඇත. ඔහු පොත් කියවන ග්‍රහයාය. ඒ නිසාම ඔහුට ආදරය කරන ජන්මියාගේ නැණ නුවණේ දොරගුළු ද ඔහු විසින්ම විවෘත කරනු ලබයි.

ඔබ අද ජීවත් වන්නේ කේතුගේ මේ අඳුරු සෙවණැල්ල යටද? ජීවිතය එපා වී, කලකිරීමෙන් තනි වී සිටින ඔබට, අතීතයේ සිටම පැවත එන ඒ ගුප්ත මඟ ඉතිරිව තිබේ. උදෑසනක් පාසා ඔබ තබන පූජාවක වටිනාකම කෙතරම්දැයි ඔබ දන්නේ නැත. රතු මල්, නිල් මල්, පුවක් මල් සහ කෙසෙල් මුව මල්වලින් පිරුණු තැටියක්, පස් තෙල් පහනක එළියෙන් බැබළෙන විට, ඔබේ දෑස් ඉදිරිපිට දිලෙන තද නිල් සහ රතු පැහැති කොඩි දෙස බලන්න. ඒ කේතුගේ බලය සන්සුන් කරන විශ්වීය ආරාධනාවයි. උඳු සහ තල මිශ්‍ර කිරිබත්, මීකිරි, මී පැණි සහ කැවිලි සමග අගිල් සුවඳ දුම් පූජාව අතපසු නොකරන්න.

වයඹ දිශාව දෙසට හැරී, ධජග්ග සූත්‍රයේ හෝ බන්ධ පරිත්තයේ සුවඳ ඔබේ නිවස පුරා විහිදුවන්න. තවමත් ඔබ පොල් ගෙඩියක් බැගින් ගෙන දින හතක් ගිලන් වූ සිතින් පිරිත් කර පොල් ගැසුවේ නැත්නම්, ඒ ප්‍රාතිහාර්යය අත්හදා බලන්න. මහා දශාව, අතුරු දශාව හෝ ඒරාෂ්ටක අපල මොනවා වුවත්, ඔබේ මනසින් කේතුගේ ඒ උඩුකය මනුෂ්‍ය රුවට ආමන්ත්‍රණය කරන්න. කලකිරුණු ජීවිතයකට නව නුවණක් සහ නැවුම් මාවතක් පෙන්වා දීමේ බලය ඔහු සතුවම පවතී. කේතු යනු බිය විය යුතු චරිතයක් නොව, නිවැරදිව තේරුම් ගත යුතු රහසක් පමණි.

ජ්‍යොතිෂවේදී
ඔස්මන් පෙරේරා





ඔවුහු පැමිණ ඔබ සතු සියල්ල උදුරාගෙන, ඔබේ හදවත කැබලිවලට බිඳ දමා එකදු හැරී බැලීමකින් තොරව නික්ම යති.

# පස්සෙන් පන්නන පෙර ආත්මේ ණයකාරයෝ



**අහඹු ලෙස පාරේදී උරහිස හැපී යන දහස් ගණනක් මිනිසුන් අතර, එකම එක මිනිසෙකු දෙස විතරක් ඔබේ දෑස් නතර වුයේ ඇයිදැයි ඔබ කවදා හෝ සිතා තිබේද? කිසිදු ලේ නෑකමක් නැති, මීට පෙර කිසිදා දැක නොතිබූ කෙනෙකු දෙස බලා, "මම මෙයා පණ වගේ බලාගන්නවා" කියා ඔබේ සිත ඔබටම රහසින් මුමුණද්දී, තවත් කෙනෙකු දුටු සැණින් ශරීරය පුරා කිඳා බසින අකමැත්තක් හෝ බියක් දැනෙන්නේ මන්ද? ජ්‍යොතිෂය සහ විශ්ව ශක්තිය පවසන්නේ මේ ලෝකයේ කිසිදු හමුවීමක් අහඹු සිදුවීමක් නොවන බවයි. ඔබේ කේන්දරයේ හතරවැන්න, හත්වැන්න හෝ දොළොස්වැන්න තුළ සැඟවී ඇති ග්‍රහ පිහිටීම්වලින් කියාපාන්නේ, මේ භවයේදී ඔබ පසුපස හඹා එන පෙර ආත්මයක ලියැවුණු නොපියවූ ණය ගැතිභාවයයි. අපට හමුවන ඇතැම් මිනිසුන් යනු වෙන කවුරුත් නොව, පෙර භවයකදී අප විසින් අතරමං කරන ලද, නැතහොත් අපට ආදරය දී ණයගැති වූ අපේම කර්මජ සහකරුවන්ය.**

සමහර ප්‍රේම සබඳතා දෙස බලන්න. එහි ඇත්තේ හුදු සතුටක් පමණක් නොවේ. කඳුළු, වේදනාව, විරහව සහ දරාගැනීම මැද, මුළු ලෝකයම එපා කියද්දීත් ඒ මනුෂ්‍යයාගෙන් මිදී යාමට නොහැකිව තැවෙන ගැහැනුන් සහ මිනිසුන් අපට ඕනෑතරම් හමුවේ. "ඇයි මම මෙච්චර දුක් විඳලත් මෙයා ළඟම ඉන්නේ?" කියා ඔවුන් තමන්ගෙන්ම අසන ප්‍රශ්නයට පිළිතුර ඇත්තේ කේන්දරයේ රාහු, කේතු හෝ සෙනසුරු විසින් නිර්මාණය කර ඇති කර්ම බන්ධනය තුළය. පෙර ආත්මයකදී ඔබ යමෙකුට දුන් පොරොන්දුවක්, කළ ද්‍රෝහිකමක් හෝ ඉටු නොකළ යුතුකමක බර, මේ ආත්මයේදී "ආදරය" නමැති ලස්සන ලේබලය යටතේ ඔබට වන්දි ගෙවන්නට සලස්වයි. තවත් සමහරු ඔබේ ජීවිතයට පැමිණෙන්නේ ඉතා කෙටි කාලයකටය. ඔවුහු පැමිණ ඔබ සතු සියල්ල උදුරාගෙන, ඔබේ හදවත කැබලිවලට බිඳ දමා එකදු හැරී බැලීමකින් තොරව නික්ම යති. ඔවුන් ආවේ ඔබේ ජීවිතය විනාශ කිරීමට නොව, පෙර ආත්මයක ඔබ ඔවුන්ගෙන් උදුරාගත් දෙයක හිඟ මුදල පියවාගෙන යන්නටය.

එලෙසම, ඔබේම කුසින් උපදින දරුවන් පවා මේ කර්මයේ නෑදෑයෝය. ඇතැම් දරුවන් උපන්දා සිට මවුපියන්ට

## සේසතම වනසන කර්මයේ සෙල්ලම...



කෝටිප්‍රකෝටි ගණනින් ධනය, කීර්තිය ළඟා කර දෙද්දී, තවත් සමහර දරුවන් මවුපියන් සතු සේසතම විනාශ කරමින්, මහමඟට ඇද දමා, ජීවිත කාලය පුරාම හදවතට ගින්දර දෙන්නේ මන්ද? ජ්‍යොතිෂ විද්‍යාවේ "පූර්ව පුණ්‍ය ශක්තිය" සහ "කර්මජ ණය" මගින් මෙය මනාව පැහැදිලි කරයි. පෙර ආත්මයක ඔබෙන් යමක් බලාපොරොත්තුවෙන් සිතේ බලාපොරොත්තු සුන් කරගෙන මියගිය ආත්මයන්, මේ භවයේදී ඔබේ ලෙයින් උපදින දරුවන් වී තමන්ට අහිමි වූ දේ නීත්‍යානුකූලවම ඔබෙන් උදුරා ගනිති. එය සොබාදහමේ අතිශය සාධාරණ, එහෙත් අතිශය වේදනාකාරී තීන්දුවකි. කේන්දරයක පස්වැන්න දුර්වල වී, එහි පාපී ග්‍රහයන් කොටු වී සිටින විට මෙවැනි කර්මයන් කරළියට පැමිණීම වැළැක්විය නොහැක.

කේන්දරයක පස්වැන්න දුර්වල වී, එහි පාපී ග්‍රහයන් කොටු වී සිටින විට මෙවැනි කර්මයන් කරළියට පැමිණීම වැළැක්විය නොහැක.



නමුත් මේ අඳුරු කර්ම සබඳතාවලින් මිදෙන්නට මඟක් නැද්ද? විශ්වය අපට දඬුවම් කරන්නේ වෛරයකින් නොවේ, අපව සුවපත් කිරීමටය. ඔබේ ජීවිතයට පැමිණි කෙනෙකුගෙන් ඔබට දරාගත නොහැකි වේදනාවක් දැනෙන සෑම මොහොතකම, ඔහුට වෛර කිරීම වෙනුවට, "මම මගේ පෙර ආත්මයේ ණය මේ ගෙවා අවසන් කරමි" යන සිතුවිල්ලෙන් සිත නිදහස් කරගන්න. කේන්දරයේ කොතරම් දරුණු කර්ම බන්ධන තිබුණද, මෛත්‍රී භාවනාව, ආගමික වත්පිළිවෙත් සහ නිහඬව දරාගැනීම මගින් ඒ මහා පව් පවා දියකර හැරිය හැක. ඔබට රිදවන මිනිසුන්ට ආශීර්වාද කර ඔවුන්ගෙන් ඈත් වන්න. මන්ද, ඔබ වන්දි ගෙවා අවසන් කළ සැණින්, විශ්වය විසින්ම ඒ මිනිසුන්ව ඔබේ ජීවිතයෙන් සදහටම ඉවත් කරනු ඇත. ඔබ අද විඳින වේදනාව හෙට දවසේ මහා ප්‍රඥාවක් බවට පත් කරගන්න. ඔබට හමුවන හැම මිනිසෙකුම දෙස කර්මයේ කැඩපතින් බලන්න. එවිට ජීවිතය කලකිරීමක් නොව, නිවැරදිව කියවාගත යුතු ලස්සන පොතක් වනු ඇත.

ජ්‍යොතිෂවේදී
ඔස්මන් පෙරේරා